විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 04/2016 (I)

මගේ අංකය: විවැ/චක්‍රලේඛ/2017
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10.
2017.11.24

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා නිලධාරීන් සඳහා 2005 අයවැයෙන් යෝජිත පරිදි නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)**

2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 12/2005 (VI), 2016.05.31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 4/2016 හා 2017.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 12/2005 (VII) චක්‍රලේඛයන්හි විධිවිධාන කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එමගින් ලබා දී ඇති උපදෙස් පරිදි විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 04/2016 හි 03 වන ඡේදය සහ 3.4 උපඡේදය ඉවත් කර පහත පරිදි නව ඡේදයන් ඇතුළත් කෙරේ.

> "3 - මෙම "අග්‍රහාර රැකවරණ" රක්ෂණ යෝජනා ක්‍රමය, විශ්‍රාමිකයන් සඳහා වයස අවුරුදු 70 සම්පූර්ණ වන තෙක් රුපියල් 200.00 ක මාසික දායකත්වයක් සහ වයස අවුරුදු 70 න් ඔබ්බට රුපියල් 600.00 ක මාසික දායකත්වයක් මත හඳුන්වා දී ඇති අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 12/2005 (VI) හි 04 වන ඡේදයේ නියමයන්ට අනුව පහත කොන්දේසි වලටද යටත්වේ."
>
> "3.4 - ජීවිතාන්තය දක්වා ප්‍රතිලාභ හිමිකම් ලැබිය හැකිය."

ජේ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | කරු.දැ.ගැ.ස. |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - | එම |
| 3. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | - | එම |
| 4. | ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | - | එම |
| 5. | ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | එම |
| 6. | ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | එම |
| 7. | විගණකාධිපති | - | එම |
| 8. | සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල | - | කරු.දැ.ගැ.ස හා අ.ක.ස. |